

# සීලානිසංස

සංස්කරණය

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.

# ගිහි ගෙය ගිනි ගොඩකි

දුකින් බර වුණ සිත්
සමගින් දකින විය පත්
යකඩ වැනි ගිණි ගත්
ජීවිතය ''ගිහි'' හරිම මම අත්

අඹු - දරුවො රකිමින්
මිල මුදල් ගොඩ ගසමින්
ඉසි, කෝද දරමින්
කුමට ? ගිහි ජීවිතයෙ හිඳුමින්

අසල් වැසි පිරිසට
වැඩියෙන් නඟින ඉහළට
හැඟුම් දෙන මනසට
ගිහි ගෙදර ඇත්තටම කුමකට


කුලල් කන හැමවිට
තිරිසන් සතුන් විළසට
නිවන් මඟ දැකුමට
ආයුබෝවන් කියම් ''ගිහිගෙට''

ඇති විටදි අතමිට
නෑ සියෙ සිටිති වටකොට
අසරණ වූ කෙනෙකුට
පිහිට නැති ගිහි දිවිය කුමකට

සතුන්ගේ මස්කන
දුසිරිත් වලට රොක්වුණ
අත් බවේ දුක්වන
ගිහි දිවිය - ගිණි ගොඩකි පිච්චෙන

පයාගල - සේන අම්බලම්ගොඩ
02. 09. 1999 ''බුදු සරණ''

# 50 වන ජන්ම දින සැමරුම



ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ මහා ලේඛකාධිකාරී
ත්‍රිපිටක විශාරද අති පූජනීය
**කහගොල්ලේ සෝමවංස මාහිමිපාණන් වහන්සේ**

# පෙරවදන

## " පූජාච පූජනීයානං ඒතං මංගල මුත්තමං "

පිදිය යුතු උතුමන් පිදීම යහපත ගෙන දෙන කාරණයකි. ඒ අතරින් බුදු, පසේබුදු, මහරහතන්, මව්පිය, ආචාර්ය උතුමෝ පිදීම උතුම් යහපත ළඟාකර දෙන බව අප කොතෙකුත් අසා ඇත. මරණයට පත්වන සියලු දෙනාගේ වගකීම නොමැරෙන ගුණ වර්ධනය කර ගැනීමයි. එමනිසා සීල, සමාධි, ප්‍රඥා ගුණ දියුණු කරමින් කරුණා මෛත්‍රී ගුණ පෙරටු කරගෙන මවට, පියාට මෙලොව වශයෙන්ද, පරලොව වශයෙන්ද සංග්‍රහ කරමින් ගුරු උතුමන්ගේ ගුණ සිහිකරමින් නොපමාව පාරමී ගුණ පිරීම අප සතු විශේෂ වගකීමකි. " සීලය ජීවිතයට ආභරණයකි. ජීවය විසිතුරු කර දෙන්නේ සීලයයි. සීලය ගැන ආනිසංස අතුළත් තවත් බොහෝ වටිනා දහම් කාරණා ඇතුලත්ව පවතින මෙම මහැඟි දහම් ග්‍රන්ථය ගුරු උපහාරයක් වශයෙන් 2015. 12. 18 දිනට පණස් වෙනි වියට පාතබන ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ මහා ලේඛකාධිකාරී ත්‍රිපිටක විශාරද අති පූජනීය කහගොල්ලේ සෝමවංස මාහිමිපාණන් වහන්සේට නිදුක් නිරෝගී සුව, දිඝාසිරි ප්‍රාර්ථනාවෙන් පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේ විසින් මනහර ලෙස 21 වැනි දහම් ග්‍රන්ථය වශයෙන් මෙම සීලානිසංස දහම් පොත සංස්කරණය කොට බෙදා දෙන ලදී. මේ උතුම් කුසල් බලයෙන් උපන් දිනය සිහි කරන කහගොල්ලේ මාහිමිපාණන් වහන්සේට සම්‍යක් ප්‍රාර්ථනා කෙලවර නිර්වාණාවබෝධය පිණිස වේවා ! විශාල වෙහෙසක් දරමින් " සීලානිසංස " නැමැති දහම් ග්‍රන්ථය 21 වැනි ග්‍රන්ථය වශයෙන් සංස්කරණය කළ අප පිංවත් පූජ්‍ය අකුරේගොඩ රතනසාරහිමිපාණන් වහන්සේට නිදුක්ව, නිරෝගිව මෙවන් උතුම් දහම් ග්‍රන්ථ එළි දක්වමින් නිවන් මඟ පාරමී පුරා ගැනීමට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමි.

දායකත්වය දරූ සියලු දෙනාටත්, දෙවියන් සහිත ලෝකවාසී සියලු දෙනාටම මෙපිං බලයෙන් නිවන් සැප වැඩිදුර නොවේවායි, මෛත්‍රී සිතින් ප්‍රාර්ථනා කරමි.

**" සුඛං යාව ජරා සීලං "**
**" ජරා මරණාදිය දක්වාම සිල් රැකීම උතුම් සැපයකි"**

මෙයට,
මෙතැති,
ලග්ගල කල්‍යාණවංස ස්ථවිර.

ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමය,
ගල්දූව - කහව,
අම්බලන්ගොඩ.

2015. 12. 02 දින.

# සීලානිසංස

## අංක : 21

*සංස්කරණය*

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

**න ජචචා වසලො හොති**
**න ජචචා හොති බ්‍රාහමණො**
**කමමනා වසලො හොති**
**කමමනා හොති බ්‍රාහමණො**

පින්වත් උපාසක උපාසිකාවෙනි. ඉහතකී ගාථා පාඨය පිරිත් පොත් වහන්සේගේ වසල සූත්‍ර දේශනාවට අයත් ගාථා පාඨයකි. එහි තේරුම මෙසේයි ඃ- උත්පත්ති පරපුරෙන් කිසිවෙක් වසලයකු හෝ බ්‍රාහ්මණයකු නොවන්නේය, ඔහු හෝ ඇය ක්‍රියාවෙන්ම වසලියක් හෝ වසලයෙකු (පහත් නීච ගති ක්‍රියා ඇති) වන්නේය. එසේම උත්පත්ති පරපුරෙන් කිසිම ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් බ්‍රාහ්මණද නොවන්නේය. (උතුම් ගති පැවතුම්) ඒ ඔහු හෝ ඇයගේ සීලාචාර ගති පැවතුම් පවට, ලජ්ජා භය සහ නිති පන්සිල් සුරැකීම හේතු කොටගෙන එතුමාගේ හෝ එතුමිය උතුම් ශ්‍රේෂ්ඨ ගති පැවතුම් නිසා බ්‍රාහ්මණ නම් වන සේක.

මාතෘකා ගාථා පාඨයෙන් පෙන්වා දෙනු ලබන්නේ ශ්‍රී බුඬ වර්ෂ 2490 නොහොත් ක්‍රිඃවර්ෂ 1946 අවුරුද්දේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී සඬර්මකීර්ති කරඬන ජිනරතන නායක ස්ථවිරයන් වහන්සේ විසින් සම්පාදනය කරන ලද සඬර්මඤ්ජරිය තුන්වන භාගය නමැති කුඩා ධර්මග්‍රන්ථයක් මා සතුව තිබී බුඬ වර්ෂ 2556 නොහොත් ක්‍රිඃවර්ෂ 2013 ජූලි මස 29 වන මාගේ උපන් දිනය සමරා ඉහත සඳහන් ස්ථවිරයන් වහන්සේටත් එය ප්‍රකාශක කොළඹ තරුණ බෞඬ සමිතියටත්, මුද්‍රණය කරන ලද ලඬකාභිනව විශ්‍රැත යන්ත්‍රාලභයෙහි අධිපතිතුමා ඇතුළු

කායී මණ්ඩලයටත් පිං අනුමෝදනා කරමින් පොතේ නම **සඬම් මඤ්ජරිය තුන්වන කොටස** මෙකී ග්‍රන්ථයේ යම් යම් කොටස් එකතුකර ගෙන කාලීන ධම් ග්‍රන්ථයක් වශයෙන් පින්වත් ඔබ සැම වෙත මෙසේ ඉදිරිපත් කරමි.

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

**සිත, කය, වචනය** නම් තුන් දොරින් අප විසින් සිදුකරගනු ලබන්නාවූ කුසල් අකුසල් හේතුවෙන් අපගේ ජීවිත පහත් වසල භාවයට හෝ උතුම් බ්‍රාහ්මණ භාවයට පත්කර ගැනීම සඳහා මග පෙන්වා දෙනු ලබන ධම්ාවබෝධයයි. එනම් ඃ-

## තුන්දොර

මනුෂ්‍යයා ද්වාර වශයෙන් කොටස් තුනකට බෙදනු ලැබේ. එයින් එක් කොටසක් වූ කය නොහොත් මෙම ශරීරයට අයත් අත්, පා ආදි අවයවයන් උපයෝගි කරගෙන කරන වසල භාවයට නොහොත් අකුසලයට අයත් ප්‍රාණඝාත, සොරකම, පරදාර සේවනයෙහි යෙදීම ප්‍රධානකොට කයටම සම්බන්ධ මුඛයෙන් කෙරෙන මත්ද්‍රව්‍ය, මත්පැන්, ගොඩ දිය මස්, මාළු අනුභවය, බොරු කීම, කේළම් කීම, පරුෂ වචන කීම ආදී අනෙකුත් නරක පැත්තට බර කියුම්, සංඥ්ඥාදියත් වේ. සිතෙන් ප්‍රධාන කොට කෙරෙන අන්සතු වස්තුව කෙරෙහි ඇතිවන්නාවූ ලෝභය සහ ඊර්ෂ්‍යාව සහ ක්‍රෝධය, මාන්නය, පළිගැනීමේ සිතිවිල්ල සහ මිථ්‍යා දෘෂ්ටිය නිසා ඇතිකර ගනු ලබන්නාවූ මහත් විනාශය ආදීයත්ය.

මෙතැන් සිට දස අකුසල් සහ දස කුසල් පිළිබඳව වෙන් වෙන්ව විස්තරයක් ඉදිරිපත් කරමි. අපගේ බෞඬ පින්වතුන් ප්‍රාණ ඝාතය, අදින්නාදානා, කාමේසු මිච්චාරා, සුරාමේරය පිළිබඳව බොහෝ සෙයින් දැනුවත්ව සිටින නිසා තව තවත් අටුවා ටීකා අවශ්‍ය නැත. ඒ වෙනුවට මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි සිල්පදයේ සිට ඉදිරියට විස්තරයක් ගෙන එමි,

එනම් ඃ - තථාගතයන් වහන්සේ විසින් පිතෘ ඝාතක අජාසත් මහරජතුමා මහත් භයින් සන්ත්‍රාණයෙන් කම්පා වෙමින් තථාගතයන් වහන්සේගෙන් පිහිටක්, අනුකම්පාවක් බලාපොරොත්තුවෙන් පියා මැරවීමේ පාපකර්මය වෙනුවෙන් සහනයක් අයැද සිටි අවස්ථාවේ මෙසේ වදාළ සේක.

'' අජාතසත්‍ර මහ රජතුමනි, යමෙක් යම් කිසි වැරදි ක්‍රියාවක් කර ඉන්පසු ඒ වෙනුවෙන් කම්පා වෙමින්, ශෝක වෙමින්, දුක් වෙවී ඉඳීම නොව අවශ්‍ය වන්නේ කළ වරද වරදක් ලෙසට තේරුම් ගෙන මින් මතුවට ඒ කරන ලද වරද නිසා මාගේ අනෙකුත් මෙවන් වැරදි සිතිවිලි සහ ක්‍රියාවලින් මිදෙමි'' යි ස්ථිර සිතිවිල්ලෙන් යුතුව ක්‍රියා කිරීමයි. එවිට එම අවස්ථාවේ පටන් යහපත් සිතිවිලි, ක්‍රියාවන්හී යෙදීමෙන් යහපත් ප්‍රතිඵල උදාවේ. දුගතිගාමී වීමේ මාර්ගයෙන්ද මිදීමට හේතු වාසනා වේ. එමනිසා තම තමන්ගේ සිතින්, කයින්, මනසින් මෙතෙක් සිදුවූ වරද වරදවල් හැටියට තේරුම් ගෙන යහපත් ක්‍රියාවන්හී යෙදෙන්න.

**(1) මුසාවාද (2) පිසුණාවාචා (3) ඵරුසාවාචා (4) සම්ඵප්‍රලාප** යන මෙකී සතරාකාර වාග් ව්‍යවහාරය වාචසික අකුසල් නම් වෙත්, මේ වාක් දුශ්චරිතය බොහෝ සේම වාග් ද්වාරයෙහි පවත්නා හෙයින් වාග් ද්වාරික අකුසල් නම් වෙත්. ඇතැම් විට දන්නා දේ නොදන්නා ලෙසටත්, නොදන්නා දේ දන්නා ලෙසටත්, අත් වැනීම්, හිස වැනීම් ආදී යම් කිසි කායික ක්‍රියා විශේෂයකින් සංඥාවක් කළොත් එසේ කරන්නා හට යථෝක්ත වාග්චාරික පව් කායචරික වන්නාහ. බොරු කීමාදියට කැමතිවීම වශයෙන් මනෝචරිකද වන්නේය. එනමුත් බෙහෙවින්ම බොරු කීමාදී සතර වාග් දුශ්චරිතය වචනයෙන්ම සිඩයන හෙයින් වාචසික නම් වෙත්,

**(1) මුසාවාදය**

නම් සාක්ෂි කීමට උසාවියකට ගිය විටෙක හෝ, පිරිසක් මැදට ගිය විටක හෝ ඥාති සමූහයා වෙත ගිය විටෙක හෝ, තනි කෙනෙක් සමඟ හෝ තමා නොදුටු, නොඇසූ, නොදන්නා දේ දුටු දන්නා දේ හැටියටත්, දුටු ඇසූ දන්නා දේ නොදුටු නොඇසූ නොදන්නා දේ හැටියටත්, කරන අභූත කථාවයි. මෙකල හැටියට මෙකී දේවලටත් වඩා බලගතු පාපකර්මය නම් හොර ඡන්ද පාවිච්චි කිරීමයි. එය මෑත කාලයේදී ආත්මාර්ථ පුද්ගලයන් බහුලවීම නිසා විෂම සමාජයට අළුතෙන්ම එක්වූ බොරු කිරීමේ බරපතලම පාපකර්ම යකි. මොන ස්වරූපයෙන් කලත් මේ අටමහ නිරයන්හි උපදවන දිගුකල් දුක්දෙන භවයෙන් භවයට එන පාපකර්ම අකුසල බැව් තේරුම් ගන්න.

**(2) පිසුණාවාචා**

ඔවු නොවුන්ගේ සමඟිය, ප්‍රිය භාවය සිඳ බිඳ දමා, භේද බින්න කරවා, සමාජයට, ලෝකයට අනර්ථයක් සලස්වාලනු කැමති දුෂ්ට පාපී පුද්ගලයින් විසින් එතන කීදේ අසාගෙනවුත්, මෙතන හෝ, මෙතන කී දේ අසාගෙන ගොස් එතන කියා ඔවු නොවුන් භේද කරවන කථාව කේලම් කීමය'යි දතයුතුයි,

**(3) ඵරුෂ වචන**

අසත්නවුන්ට අප්‍රිය අමනාප උපදවන, කන් පීඩා කරන, කණිකටුක නපුරු නීච නින්දිත වචන කීමයි. ක්‍රෝධය බහුල කොට ඇති මනුෂ්‍යයෝ බොහෝසේම අනුන්ට නින්දා අපහාස පිණිස මෙසේ කර්කශ වචන පාවිච්චි කරති. එයින් ඔවුහු උපදවා ගන්නා පාපකර්මය ඔවුන්ටම බොහෝ සෙයින් අති දීර්ඝකාලීනව නිරයන්හිදී පමණක් නොව මතු යම් දවසක මිනිසත් ආත්ම භාවයක් ලදත් එහි විපාක විඳවන්නට සිදුවේ.

**(4) සම්ඵප්‍රලාප**

නිස්කාරණයේ හිස් බොල් වචන දෙඩවීමයි. තමන්ටවත්, අන්‍යයන්ටවත්, මෙලොවත්, පරලොවත් මහත් අනර්ථය පිණිසම පවතින්නේය. මෙය බොහෝ විට උඩඟු මෝඩයන් විසින් තමාගේ කැපී පෙනීම අරඹයා සම්ඵප්‍රලාප දොඩවයි.

# <u>මානසික අකුසල්</u>

**<u>(1) අභිධ්‍යාව (2) ව්‍යාපාදය (3) මිථ්‍යාදෘෂ්ටිය</u>**

යන මේ අකුසල් තුන කය, වචනය යන ද්වාර දෙකේහි නොව සිත තුළම හටගන්නා බැවින් මානසික අකුසල් නම් වෙත්, මෙයට ඊර්ෂ්‍යා, මද, මාන, උද්ධච්චාදි බොහෝ පව් සිත් තුළ හටගනිත්, ඒ සියල්ලද මානසිකමැයි, නමුත්, අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි යන මේ මනෝද්වාරික මහා පාප තුන ඇති කල්හී අන්‍යවූ සියලු මානසික පව් ඇතිවන හෙයින් දශකුශල කර්මපථයෙහි මේ ප්‍රධාන අකුසල් තුණ පමණක් දක්වන ලදී.

අභිධ්‍යාව, නම් තමන් සතු දෙයෙහි පමණක් නොව අන්සතු වස්තුව කෙරෙහි පවා හටගන්නා විෂම ලෝභය වේ. අන්‍යයන් සතු වස්තුව තමන්ට වේවා යයි සිතා දළ ලෝභය, අභිධ්‍යාවයි දත යුත්තේය.

**<u>(2) ව්‍යාපාදය නම්</u>** ක්‍රෝධයයි, විනාශ කරන නපුරු චේතනාව ව්‍යාපාදයයි දත යුතුයි. කරුණා ගුණ විරහිත ඒ ව්‍යාපාදය ඇති පුද්ගලයා අනුන්ට නපුරක්ම කිරීමට ආසා වන්නේය. නපුරක්ම සිතන්නේය, කියන්නේය, කරන්නේය. මේ ක්‍රෝධය දශාකාරයකින් හටගන්නා බැවින් දශවිධ අසාත යයි කියන ලදී.

**<u>(3) මිථ්‍යා දෘෂ්ටිය -</u>** වරදවා ගත් ලබ්ධියයි. දුන් දේ ඵල නැත. පින් පව් කම්පල නැත. මව් පිය උපස්ථානයේ පල විපාක නැත. මෙලොව, පරලොවක් කියා වෙනම දෙයක් නැත, යනාදී වශයෙන් ගන්නාලද දරුණු මිථ්‍යා දෘෂ්ටියද, තෙරුවන් නැත, ආත්මයක් ඇත. මැවුම්කරුවෙක් ඇත. යනාදී වශයෙන් ගන්නා ලද දුලීබධියද මිථ්‍යා දෘෂ්ටිය'යි දත යුතුයි.

ඉහත සඳහන් කරන ලද සිත, කය, වචනය යන තුන් දොරින් සිදුවන දස අකුශල කර්මවිභාගය බොහෝ විස්තරාත්මක කථා මාර්ගයකි. මෙහි සඳහන් කරන ලද්දේ එහි අඩංගු සාරාංශ අදහස පමණයි. එමනිසා ධර්මධර තෙරුන් වහන්සේලාගේ සහ අනෙකුත් පින්වතුන්ලා පොත් පත් ඇසුරු කොට එහි විස්තර දැන ගැනීමට උත්සහ කළ යුතුයි. මෙකී අකුශල කර්මයන්ගේ හට ගැනීමට හේතුවන ස්වභාවය ධර්මයෝ අකුසල් මුල් වශයෙන්ද වදාරණ ලද්දාහ. ඒ මෙසේයි,

**''තීනමානි භික්ඛවේ අකුසලමූලානි, කතමානිතීනි ලොභො අකුසල මූලං, දොසො අකුසල මූලං මොහො අකුසල මූලං''**

''මහණෙනි, මෙම අකුසල මූලයෝ හෙවත්, අකුසල කර්මයන්ගේ හට ගැනීමට මුල් හේතු ධර්මයෝ තුන් දෙනෙක් වෙති. ඒ කවර නම්, අකුසල මූලයන් තිදෙනෙක්ද යත් ඃ- ලෝභය අකුසල් හටගැනීමට මුලකි, ද්වේශය අකුසල් හට ගැනීමට මුලකි, මෝහය අකුසල් හට ගැනීමට මුලකැ''යි වදාළ සේක.

සාමාන්‍ය වශයෙන් සියලු අකුසලයන්ට මුල් හේතු කාරණා තුනක් මෙසේ වදාළ නමුත්, දස අකුශලයන් අතුරෙන් ඒ ඒ අකුසලයන්ට ඒවා මුල් වන හැටි වෙන වෙනම මෙසේ දක්වා තිබේ.

කාමයෙහි වරදවා හැසිරීම සහ අවිද්‍යාවද, මිථ්‍යා දෘෂ්ටියද්‍ද යි යන මේ පව් තුන ලෝභය මුල්කොට හටගණිත්,

ප්‍රාණඝාතය, පරුෂ වචනය, ක්‍රෝධය නොහොත් වෛරය යන මෙම පාප තුන ද්වෂය මුල් කොට හටගණිත්,

ඉතිරි පාප කර්ම හතර නම්, හොරකම, බොරු කීම, කේළම් කීම, හිස් බොල් වචන කීම යන මේ පව් සතර ලෝභ, ද්වෂ, මෝහ යන අකුසල් මුල් තුනෙන්ම හටගණිත්,

# අකුශල කර්ම විපාක

අකුශල කර්මයෝ නම් යථෝක්ත දශ අකුශල ක්‍රියාවන් කරණ කාලයෙහි, ඒ ඒ නරක ක්‍රියාවන් අරමුණු කොට හටගන්නා සිත් තුල ඇතිවන ලෝභ, ද්වේෂ, මෝහාදි අපිරිසිදු චෛතසික ධර්මයන් නිසා පහළ වන චෙතනාවෝයි. එයින් හටගන්නා විපාක විඤ්ඤාණයෝ ඒකාන්තයෙන් දුක් වන්නාහ. නපුරු වන්නාහ. එහෙයින් එකී දස අකුසල් කළවුන්ගේ විපාක විඤ්ඤාණයෝ අනන්ත ප්‍රභේද (වෙනස්) ඇති සතර අපායෙහිද, එයින් මිදී ඉතිරිවූ කර්මය ඇති කල්හී මිනිස් ලොව අඳ, ගොළු, බිහිරි, කොරව, කුඳුව, සා පිපාසා දුකින් පෙළෙන රෝගාතුර, කෙළ තොළු, කාලකණ්නිව ඉපිද, අප්‍රමාණ දුක් කරදර විඳින්නාහ.

ඒ පව්කළ සත්වයන්ගේ දුක් විපාක විදීමට යෝග්‍ය වූ උත්පත්ති ස්ථාන වශයෙන් අනේක විධ ප්‍රභේද ඇති සතර අපායක් වෙත්, **(1) නිරය (2) ප්‍රේත අපාය (3) අසුර අපාය (4) තිරිසන් අපාය යයි.**

**(1) නිරය නම් ඃ-** සඤ්ජීවය, කාලසූත්‍රය, සංඝාතය, රෞරවය, මහා රෞරවය, තාපය, ප්‍රතාපය, අවිචි යයි, කියන ලද අටමහ නිරය ප්‍රධාන කොට ඇති 136 ක් ඔසුපත් නිරයෝයි. මෙකී සියලුම නිරයන් මේ අප ජීවත්වන පෘතුවිය මතම පිහිටා තිබේ. එයට අමතරව අපගේ පෘතුවියෙන් බොහෝ ඈතින් පිහිටා තිබෙන ලෝකාන්තරික නරකයන්ද තිබේ. මේ සියලුම නරකයන් සත්වයන්ගේ අකුශලකර්ම විපාකානුභයට යෝග්‍යව හටගැනී තිබෙත්,

මෙකී අපායයෝ යොදුන් ගණන් විශාල කුහර ඇති ගිනිගෙන දිළිසෙන යපොළොවෙන් හා එසේම වූ බිත්ති වලින්ද එසේම ගිනිගත් යපියන් පතින්ද, වැසී සතරැස්ව පිහිටියාහුය. ඒ තුළ පිරී තිබෙන සොරවූ ගිනි ජාලාවෙන් හා ගිනිගෙන දිළිසෙන යමුගුරු ගත් අත් ඇති

යමපල්ලන් ගෙන්ද, රෞද්‍රවූ ක්‍ෂාරවායු වේගයෙන් සහ ඝොර නාදයෙන් කකියා වැහෙන ලෝහාදියෙන්ද, එහි උපදින සත්වයන්ට මහදුක් දෙන ගිනිගත් යමුගුරු, යවුල්, කියත්, වෑ, පොරෝ ආදී ගිනිදැල් විහිදුවන ආයුධ වලින්ද පිරී තිබේ. එහි උපදනා සත්වයෝ අවුරුදු ලක්‍ෂ, කෝටි, ප්‍රකෝටි, අතුරු කල්ප, මහා කල්ප සංඛ්‍යාත අතිදීර්ඝ කාලයක් මුළුල්ලෙහි ඇසිපිය ගසන මොහොතකදු අතුරක් නැතිව අනන්ත, අප්‍රමාණ, අති භයංකාර මහ දුක් විඳින්නේය. එසේවූ කොපමණ දුක් වින්දත් මිනිසත් භාවයේ සිටියදී කරගත් අකුශල පාපකර්ම බලයේ මහිමයෙන් ඔවුන් අතිදීර්ඝ කාලයන්හිද නොමැරෙත්, මැරුණත් කර්ම බලයෙන් එහිම එසැණින් නැවත නැවත ඉපෙදමින් මහා දුක් විඳින්නාහ.

මේවා ගැන නොසිතන්නාවූද, නොදත්තාවූද මනුෂ්‍යයෝ නොයෙක් ලෙසින් පව්කම් කොට මේ සා මහත් දුකින් පිරුණා වූ නිරයෙහි ඉපිද බලවත් දුක් විඳින්නාහ. මුඛ දහසකින් විස්තර කළත් අටමහ නිරයෙහි දුක් කෙසේනම් කියා නිම කරන්නද ? නොහැකි වන්නේමය. ඇවිලගත් ගිනි ජාලාවෙහි පිළිස්සෙන ශරීර ඇති සත්වයාහට කෙතරම් දුකක් වේදනාවක් ඇත්ද ? අප්‍රමාණ දුක් විඳින්නේමය.

තවද මේ ලොකයෙහි යම් කෙනෙකක් ශ්‍රද්ධාගුණ නැත්තේද සද්ධර්ම ශාසනයෙහි ප්‍රසන්න නොවූ ගන්නා ලද මිථ්‍යා දෘෂ්ටි ඇත්තාවූ මසුරුවූ තද මසුරුකම් ඇත්තාවූ, රළු ගුණ ඇත්තාවූ, කරුණා ගුණ නැත්තාවූ, මෛත්‍රී සහගත මෘදු සිතත් නැත්තාවූ, මේ දේ කිරීමෙන් සත්වයන්ට දුකක් නොවේදැයි යන චිත්තමාත්‍රයකුදු නො උපදවා සත්වයන් මරන්නාවූ, වධ පිණිස බන්ධනය කරන්නාවූ, කපා කොටා ප්‍රාණ ඝාත කරන්නාවූද, අනුන් සතු නොදුන් දේ සොරකම් කොට හෝ බලහත්කාරයෙන් හෝ වංචාවෙන් ගන්නාවූද, එසේම පර ස්ත්‍රීන් කෙරෙහි අපරාධ කරන්නාවූද, අනුන්ට අවැඩ පිණිස බොරු සාක්ෂි ආදී මුසාවාද කියන්නාවූද, සුරා පානය කරන්නාවූද, පඤ්චානන්තර්ය කර්මය කරන්නාවූද, බුද්ධාදි රත්නත්‍රයට නින්දා අපහාස කරන්නාවූද, පාපී මනුෂ්‍යයෝ ඉහත කියන ලද අටමහ නිරයෙහි උපදින්නාහ, යනු කෙටි අදහසයි.

## දශ අකුශල විභාගය සහ අකුශල මූල විභාගය

**විභාගය**

දකුණත් සව් ශාරිපුත්‍ර මහරහතන් වහන්සේ ' සම්මා දිට්ඨි ' සූත්‍රයෙහි භික්ෂූන්ට වදාලේ මෙසේය ඃ- '' ඇවැත්නි, පාපය නම් කුමක්ද ? ප්‍රාණඝාතය පාපයකි, හොරකම පාපයකි, කාමයෙහි වරදවා හැසිරීම පාපයකි, බොරු කීම, කේළම් කීම, නපුරු වචන පාවිච්චි කිරීම, සම්පප්‍රලාපය පාපයකි, අන්සතු වස්තුව කෙරෙහි ඇති කරගන්නා ලෝභය පාපයකි, අන්‍යයන් කෙරෙහි සිතෙන් වෛර කිරීම, පළිගැනීමේ චේතනාවෙන් සිටීම, අවස්ථාව පැමිණිවිට පළිගැනනීම පාපයකි, මිථ්‍යා දෘෂ්ටිය පාපයකි ''

'' ඇවැත්නි, අකුශල මූලය කුමක්ද ? ලෝභය අකුසල් හටගැනීමේ මූලකි, වෛරය අකුසල් හටගැනීමේ මූලකි, මෝහය (මෝඩකම) අකුසල් හටගැනීමේ මූලකි. ඇවැත්නි, මේ අකුසල් මූල්ය'' යි, වදාළ සේක.

## දශකුශල විභාගය සහ කුශල මමූල වවිභාගය

'' ඇවැත්නි, පිණ නොහොත් කුසලය කුමක්ද ? පරපණ නැසීමෙන් සහ එයට අනුබල දීමෙන් වැළකීම කුසලයකි, අදත්තා දානයෙන් වෙන්වීම පිණකි, කාමයෙහි වරදවා හැරීමෙන් වෙන්වීම කුසලයකි, බොරුකීමෙන් වෙන්වීම කුසලයකි, සම්ඵලාපයෙන් වෙන්වීම කුසලයෙකි, අන්සතු දෙයට ආශා නොකිරීම කුසලයකි, මෛත්‍රිය කුසලයෙකි, සම්‍යක්දෘෂ්ඨිය (මෙකී දශ කුසලා කුසල විභාගය මනාසේ අවබෝධ කරගෙන ඉහත කී අකුශල කර්මයන්ගෙන් වැළකී කුශල ධර්මයෙහි යෙදිය යුතු වග මනා කොට දන්නා) ඥාණය කුසලයකි, ඇවැත්නි, මෙයට කුසලයයි (පිණ) කියනු ලැබේ'' යයි සැරියුත් මහ රහතන් වහන්සේ විසින් දේශනා කොට වදාළ සේක. නැවතද මෙසේ වදාළ සේක,

'' ඇවැත්නි, කුසල මූලය කවරේද ? අලෝභය (ලෝබ නැති බව) කුසල් හට ගැනීමට මුලකි, ක්‍රෝධ නොකිරීම කුසල් හට ගැනීමට මුලකි, අමෝහය (සම්‍යක් ඥානය) කුසල් ඉපදවීමට මූලයකි, ඇවැත්නි, මේ කුසල මූලය'' යි වදාළ සේක.

## දස පුණ්‍යක්‍රියාවේ

| | | |
|---|---|---|
| (1) | සතුටු සිතින් දෙන දානය | පුණ්‍යක්‍රියා වස්තුව |
| (2 | සීලමය සිතින් දෙන දානය | පුණ්‍යක්‍රියා වස්තුව |
| (3) | භාවනාමය සිතින් දෙන දානය | පුණ්‍යක්‍රියා වස්තුව |
| (4) | පිදිය යුත්තන් පිදීම | පුණ්‍යක්‍රියා වස්තුව |
| (5) | පිදිය යුත්තන්ට උපස්ථානන කිරීමේ | පුණ්‍යක්‍රියා වස්තුව |
| (6) | තමන් විසින් කරගත් පින් අන්‍යයන්ට අනුමෝදනා කිරීමේ | පුණ්‍යක්‍රියා වස්තුව |
| (7) | අනුන් කරන පින් අනුමෝදනා කිරීමේ | පුණ්‍යක්‍රියා වස්තුව |
| (8) | ධර්ම ශ්‍රවණය කිරීමේ | පුණ්‍යක්‍රියා වස්තුව |
| (9) | ධර්ම දේශනා කිරීමේ | පුණ්‍යක්‍රියා වස්තුව |
| (10) | දෘෂ්ටිර්ජුකර්ම පුණ්‍යක්‍රියා වස්තුව දැයි යන මොව්හු දස ( පින්කිරියවත් නම් වෙත්, | |

මෙම දස පුණ්‍ය ක්‍රියාවන් පිළිබඳව කෙටි විස්තරයක් පහත සඳහන් කරමි.

### (1) දානමය පින්කිරියාවත

දුගී, මගී, යාචක, මහණ, බමුණු, ආදී දිය යුත්තන්ට දන් දීමයි. නොදෙනු කැමති මසුරුකම සහ ලොභ මැඩපවත්වා සිත හටගන්නා දෙනු කැමති බව එනම් තමාගේ අයිතිය මුදා දියයුත්තන්ට දෙන අවස්ථාවේදී අලෝභ, අද්වේෂ, අමෝහ, සංඛ්‍යාත පවිත්‍ර වූ කුශල මූල චෛතසිකයන්ගෙන් යුක්තව සිතේ හටගන්නා පරිත්‍යාග (දීමනාව සිඬකරණ) චේතනාව දානමය පින්කම් වේ.

## (2) ශීලමය පුණ්‍යක්‍රියාව

කය, වචනය දෙක වරදින් මුදවා මනා කොට පිහිටුවා ගෙන හික්මීමයි. ප්‍රාණවධ සහ හොරකම් වරදින් මිදීම පිණිස සමාදන් වීමට පනවා තිබෙන ශික්ෂාපද සමාදන් වීමෙන් හෝ එබඳු වරදකට යෙදෙන්නට සූදානම් වූ කල්හි එහි අනිටු විපාක සළකා ඒ ඒ පාපක්‍රියාවෙන් වළකකින අවස්ථාවෙහි හෝ ඒ ඒ වරදින් වැළකී බැව් සිතට හඟවන විරති චේතනාවෝ ශීල නම් වෙත්, සත්තව ඝාතනාදී කායික අකුසල ක්‍රියාවන්ගෙන් හෝ සිත වළක්වා ගන්නා පවිත්‍ර චෛතසිකයෝ විරති චේතනා නම් වෙත්, එම උතුම් සිතේ හටගන්නා ස්වභාවයෙන් ශීලමය පින් කිරියවත නම් වෙත්.

## (3) භාවනාමය පුණ්‍යක්‍රියාව

අවිද්‍යාව හෙවත් චතුරාර්‍ය්‍ය සත්‍යධර්‍මය නොදන්නා මෝඩකම සහ කාම තෘෂ්ණාදි, දුඃඛදායක පාපධර්‍මයෙන් සිත තුලින් නැතිකර දමා සැපදායක උත්තම ගුණධර්‍මයන් පුරුදු කිරීම පිණිස සිත්හි ලා නිතර සේවනය කටයුතු (සිහිනුවණින්) මෙනෙහි කළ යුතු යම්කිසි බුඬානු සමෘති ආදී ශුඬ (පිරිසිදු) ධර්‍මයකින් සිත පුරුදු කිරීම භාවනාමය පිණකි.

## (4) අපචායන පුණ්‍යක්‍රියාව

බුඬාදී රත්නත්‍රය කෙරෙහිද, සිල්වත් ගුණවත් උතුමන් කෙරෙහිද, මව්පිය ගුරුවරාදි පිදිය යුත්තන් කෙරෙහිද, පූජා සත්කාර ගරු බුහුමන් කිරීමයි. ඒ උතුමන් කෙරෙහි ආදර ගෞරව උපදවන ලෙස කය වචනය පිහිටුවා ගැනීම සහ පුද සිරිත් කිරීමද, සිතින් ගරු කිරීමද යන අදහසයි.

## (5) වෙයාවච්ච පුණ්‍යක්‍රියාව

ඒ ඒ උතුමන් කෙරෙහි උපස්ථාන වශයෙන් ඒ ඒ කුදුමහත් වත් පිළිවෙත් කටයුතු කිරීමයි. සිල්වත්, ගුණවත් උතුමන්ට අත් පා මෙහෙවර ඈප උපස්ථාන කටයුතු කිරීම වතාවත් කිරීමේ පින් කිරියවතය යන අදහසයි. එබඳු මෙහෙවර කිරීමෙහි උපදනා පිරිසිදු චේතනාවෝය.

## (6) ප්‍රාප්තිදාන පුණ්‍යක්‍රියාව

තමන් විසින් කරගත් පින් අනුන්ට අනුමෝදන් කිරීමයි, හෙවත්, තමන්ගේ චිත්ත සන්තානයෙහි හටගත් කුශල චේතනාවෙන් අනුන්ට සැප කැමති වීමයි, කියන ලද කරුණා මෛත්‍රියෙන් යුක්තව සිහිපත් කරවා අන්‍යයන්ගේ සිත් තුලද උපදවාලීම නිසා සිදුවන පින්දීමේ පින්කමය යන අදහසයි.

## (7) පත්තානුමෝදනා පුණ්‍යක්‍රියාව

අනුන් කළ පින් අනුමෝදන් වීමයි, හෙවත්, අනුන් විසින් කරන පින්කම් දැක අසා සතුටුව ශ්‍රද්ධාව උපදවාගෙන තමනුත්, එයට සිත යොමු කරමින් එය ඉතා යහපතකැයි නුවණින් සළකා තමාගේ සිත තුලත් දානශීලාදී කුශල චේතනාවන් උපදවා ගැනීම පුණ්‍යයානුමෝදනා පුණ්‍යක්‍රියාවය යන සංක්ෂේප අදහසයි.

## (8) ධර්මශ්‍රවණමය පුණ්‍යක්‍රියාව

ශ්‍රද්ධාවෙන් මනා කොට බණ ඇසීමයි. ධර්මදේශනා කරන කල්හි මහත්වූ ධර්ම ගෞරවය උපදවා ගෙන සසර දුක් ගෙවන උපාය දැන ගැනීම යයි සිතා අර්ථ ධර්මයන් මෙනෙහි කරමින් සිතට වැටහෙන පරිද්දෙන් ධර්ම

ශ්‍රවණය කිරීම, ශ්‍රවනමය පුණ්‍යක්‍රියාවයි. එයින් සිත හටගන්නා පිරිසිදු ප්‍රඥා සහගත චේතනා රාශිය ශ්‍රවණමය කුශලධර්මයෝ නම් වෙත්,

## (9) ධර්මදේශනා පුණ්‍යක්‍රියාව

කරුණා මෛත්‍රියෙන් යුතුව අසන්නවුන්ට ධර්මදේශනා කිරීමයි. මේ පින්කම අතිශයින් උතුම් වූ පින්කමකි. ශීලාදි උත්තම ගුණධර්මයන් රක්‍ෂා කරන සත්ව කරුණාව ඇති සත්පුරුෂ ධර්මධරයන් විසින්ම කටයුතු මහ පින්කමකි. ලාභ සත්තාරදියක් නොසළකා කරුණා මෛත්‍රී සිතින් යුක්තව, ආගම නීතිය මනා සේ අවබෝධ කරගෙන ධර්ම ක්‍රමයන් නොවරදවා, ධර්මට දේශනා කිරීම නිසා පහළවන උදාතර කුශල චේතනාවෝ, දේශනාමය පින්කම් නම් වෙත්.

## (10) දිට්ඨුජ්ජ කම්ම

හෙවත් දැක්ම ඍජුකිරීම යයි කියන ලද පුණ්‍යකර්මය නම් සම්‍යක් දෘෂ්ටි ඥානය ඍජුව, ස්ථිරව පිහිටුවා ගැනීමයි. කරන ලද කුශලා කුශල කර්මයන්ට අයත් සුවදුක් විපාක ඵල නොවරදවා ලැබෙන බව මනාසේ අවබෝධ කර ගැනීමෙන්ද, රත්නත්‍රය කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් ශක්තිමත් වීමෙන්ද, චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය දැන ගැනීමෙන්ද සම්‍යක් දෘෂ්ටි ඥානය ඍජු වන්නේය. ස්ථිර වන්නේය. චඤ්චල නොවන්නේය. එබඳු ඍජු සම්‍යක් ඥානය සමඟ පැවති චේතනාවෝ, දෘෂ්ටිය ඍජු කිරීමේ පුණ්‍යක්‍රියා නම් වෙත්.

## දස කුශල කර්මයන්ගේ ප්‍රභේද

**'' දානං සීලං භාවනා පත්තිදානං**
**වෙය්‍යාවච්චං දෙසනාවානුමොදො**
**දිට්ඨුජ්ජුකම්මං සංසුති චාපචායො**
**ඤෙය්‍යා එවං පුඤ්ඤවත්ථු පපභෙදො''**

ඉහත සදහන් ගාථාවෙන් ප්‍රකාශ වන්නේ මෙහි දක්වන ලද දශ පුණ්‍යක්‍රියාවන්ගේ නම් දහය පමණයි, දානය ශීලය, භාවනාව, පින්දීම, වතාවත් කිරීම, ධර්ම දේශනාව, පුණ්‍යානුමෝදනාව, සම්‍යක් දෘෂ්ටිය ඍජුකර ගැනීම, බණ ඇසීම, පිදිය යුත්තන් පිදීම යන මෙකී දානය පුණ්‍යක්‍රියා වස්තුන්ගේ ප්‍රභේදයයි දත යුත්තේය. මෙසේ දක්වන ලද දසකුසල් දොළොස් කුසල් වශයෙන්ද පහත සඳහන් වේ.

මෙහි කියන ලද පින්කම් සිහිකිරීම ආදී අනුස්මෘති පින්කම හා සරණයද ප්‍රශංසාවදැයි යන මේ තුන් කොටස පළමු කී දස වැදෑරුම් ක්‍රමයෙහි 8 වැනි දිට්ඨුජ්ජු කර්මයෙහි ඇතුළත් වන හෙයින් බෙහෙවින් දස පින්කිරියවත් යයි කියනු ලැබේ. නමුත් කල්පනා කටයුතු යම්කිසි විශේෂයක් ඇති හෙයින් දොළොස් පින්කිරිය වත් යයිද ප්‍රකාශිතය. ඒ මේ සියලු කුශල ක්‍රියාවෝ පුණ්‍යක්‍රියා වස්තු වශයෙන් ප්‍රකාශ කරන ලදී. සිතෙහි කුශල චේතනාවන්ගේ හටගැනීමට හේතු භූත ක්‍රියා සමූහයක් වන බැවින් පුණ්‍යක්‍රියා වස්තු යයි කියනු ලබත්, මෙකී සියලු කුශල ධර්මයන් ඇතුළත් කොට ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තුවක් වදාරණ ලදී. ඒ මෙහි දක්වන ලද දෙවිධියෙහිම මුලින් ප්‍රකාශිත දාන, ශීල, භාවනා යන මේ ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තුවයි.

අපගේ ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් මෙසේ වදාළ සේක. '' මහණෙනි, මෙනම් පුණ්‍යක්‍රියා වස්තුන් තුන්

දෙනෙක් වෙත්, ඒ කවරේද ? යත් :- දානමය පින්කිරියාවත, ශීලමය පින්කිරියාවත, භාවනාමය පින්කිරියාවත යන මේ පුණ්‍යක්‍රියා වස්තූහු තුන්දෙනක් වෙත් ය'' යි වදාළ සේක. පළමු කී දස පින්කිරියාවත් සහ දොළොස් පින්කිරියාවත් මෙ තුන් පින්කිරියාවතෙහි ඇතුලත් වන ආකාරය මෙසේයි.

**(1)** පත්තානු මෝදානා හෙවත් පින්දීම පින් අනුමෝදනාව යන මේ දානමය පින්කිරිය වතෙහි සංග්‍රහයට යෙත්, එසේම වෙය්‍යාවච්ච, අපචායන යන පුණ්‍යක්‍රියාවෝ දෙදෙන ශීලමය පුණ්‍යක්‍රියාවෙහි ඇතුලත් වේ.

**(2)** දේශනාමය පින්කිරිය වත සහ ශ්‍රවණමය පින්කිරිය වතද, දිට්ඨුජ්ජු කර්මයද, භාවනාමය පින්කිරිය වතේහි සංග්‍රහයට යෙත්, මෙසේ පළමු කොට දශ පුණ්‍යක්‍රියා වස්තු කෙනෙක් වූවාහු නමුත් නැවත දාන ශීල, භාවනා යයි ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු කෙනෙක් වෙත්.

**(3)** තමන් විසින් කරන ලද සියලුම පින්කම් නැවත නැවත සිහිකිරීමයි කියන ලද අනුස්මරණ පුණ්‍ය කර්මය සහ අන්‍යයන් විසින් කියන ලද පුණ්‍යක්‍රියාවන්ට සතුටින් ප්‍රශංසා කිරීමයයි කියන ලද ප්‍රශංසා පුණ්‍ය කර්මයද, සරණා ගමනය දැයි යන මේ පුණ්‍ය කර්මයෝ දිට්ඨිජ්ජු කර්ම පුණ්‍යක්‍රියාවෙහි ඇතුළත් බවට යෙත්, එහි සැකයක් නැත්තේය. යනු එහි අදහසයි.

මෙසේ දසවිධවූ ද, ද්වාදසවිධ වූද, පුණ්‍යක්‍රියා වස්තූන් මේ ත්‍රිවිධ පුණ්‍යක්‍රියාවෙහිම සංග්‍රහ වන බැවින් එහි තේරුම් මෙතැන් පටන් ලියනු ලැබේ.

**(1)** දානමය පුණ්‍යක්‍රියාව නම් තමන් සතු දියයුතු යම් දෙයක් ලෝභයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් තොරව දුගී, මගී, යාචක, මහණ, බමුණු ආදී යම් කෙනෙකුන් වෙත පරිත්‍යාග කිරීම හෝ තමාගේ අයිතිය මුදාදීමයි. එසේ දෙනදේ දෙය්‍යධර්මය යිද, එම දීමනාව කරුණා චේතනාව දානමය පුණ්‍යකර්මය යිද කියනු ලැබේ. එම දෙය්‍යධර්ම සංඛ්‍යාත දානවස්තුහු සූත්‍රාන්තික ක්‍රමයට දස ආකාර වේ. ඒ කෙසේද යත් ඃ-

**" අන්නං පානං වත්ථං යානං - මාලාගන්ධ විලෙපන සෙය්‍යා**
**වසථ පදීපෙය්‍යං - දානවත්ථු ඉමා දසං "**

ආහාර, පාන, වස්ත්‍ර, යාන, වාහන, මල්, සුවඳ,විලෙපන හෙවත් ඇඟ ගල්වන කොකුම් සුවඳ සුණු ආදිය ඇඳ, පුටු ආදී සෙය්‍යා , ආවාස ගෙවල්, ප්‍රදීප හෙවත් පහන් යන් මේ දහය දස දාන වස්තුහු නම් වෙත්,

මෙහි මනුෂ්‍යයන් අනුභව කරන ධාර්මික වූ සියලුම වර්ගවලට අයත් ආහාරද, මත් වතුර හැර පානය කල යුතු සියලුම පාන වර්ගද, සහ වාහනද, ගෙතූ නොගෙතූ සියලුම මල් වර්ග සහ සියලුම සුවඳ වර්ගද, ඇඟ ගානා සබන් ඇතුලු අනෙකුත් ඖෂධ වර්ගද, ඇඳ, පුටු, මේස, පැදුරු, පසල්, කොට්ට, මෙට්ට ආදී සියලුම සයනා සනද, ගෘහ මන්දිර ආදී සියලුම වාසස්ථානද, නානාවිධ ප්‍රදීපද යි යන මේ දස කොටස සංග්‍රහ වශයෙන් පින්පල සළකා ඒ ඒ වස්තුවෙන් ප්‍රයෝජනය ඇත්තන්ට දිය යුතු වස්තුවන හෙයින් දස දාන නම් වෙත්,

විනය ධර්මයෙහි ප්‍රකාශිත පරිදි ශාසනයෙහි දාන වස්තුහු සතර කොටසක් වේත ඃ- චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන ප්‍රත්‍යය යන මේ සිව් පසයයි.



16

**(1) එම් චීවර නම්** ඃ- හඳනා පොරෝන සිවුරුයි.
**(2) පිණ්ඩපාත නම්** ඃ- භික්‍ෂූන්ගේ යැපීමට යෝග්‍ය වූ ආහාරයයි.
**(3) සේනාසන නම්** ඃ- කුටි, ආවාස, පන්සලයි.
**(4) ගිලාන ප්‍රත්‍ය නම්** ඃ- පානය කටයුතු අෂ්ට පාන වගීදි ගිලන්පසයි.

පළමු කී දස දාන වස්තූන් අතුරෙන් ගිහි පැවිදි දෙපක්‍ෂයට සාධාරණ වූ දාන වස්තු සහ ගිහි අයට අයිති වූ දාන වස්තූහු වෙත්. සිව්පසය නම් විශේෂයෙන් භික්‍ෂූන්ට යෝග්‍ය වූ ලෙස පණවා වදාළ සතර කොටසකි. එමනිසා මෙකී සිව්පසය නාමයෙන් කොටස් කරන ලද වස්තු සතර විශේෂයෙන් භික්‍ෂූන් වහන්සේලාටද, දස දානවස්තූහු ගිහි පැවිදි දෙපක්‍ෂයටද සාධාරණ වෙත්.

## ප්‍රතිග්‍රාහකයෝ

ප්‍රතිග්‍රාහකයෝ නම් යථෝක්ත දාන වස්තූන් පරිත්‍යාග කරනු ලැබීමට යෝග්‍යවූවෝ වෙත්. මේ ප්‍රතිග්‍රාහක පක්‍ෂය සාමාන්‍ය වශයෙන් දුගියෝය, මගියෝය, ශ්‍රමණයෝය, බ්‍රාහ්මණයෝය යි කොටස් හතරක් වේත, **(1) දුගියෝ නම් ඃ-** ඉතා දුකසේ සා පිපාසා දුක් ගිනි නිවා ගන්නාවූද, දිළින්දෝ වෙත්. ඔවුහු අනුන්ගෙන් දාන සංග්‍රහයක් ලැබීමට සුදුස්සෝ වෙති. **(2) මගියෝ නම් ඃ-** දුර බැහැර ගමන් මගීයෙහි මිල මුදල් උපකරණ ක්‍ෂය වීමෙන් විපතට පත් උදවියයි. ඔවුන්ද දාන මානවලට සුදුස්සෝයි. ඔවුන්ගේ ඕනෑ එපාකම් සොයා බලා පිහිට වීමද උතුම් සංග්‍රහයකි. **(3) යාචකයෝ නම් ඃ-** ගෙයක් ගෙයක් පාසා සිඟා කා ජීවත්වන සමාජයේම කොටසකි. ඔවුන්ටද පිහිටවීම උතුම් මිනිස් දමකි. **(4) ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නම් ඃ -** ගුණවත් පක්‍ෂයෙහි පිදිය යුතු උත්තමයෝයි. එහි ශ්‍රමනයෝ නම් ඃ- ගිහිගේ හැර පිවිදි වූ හෝ තාපස භාවයට පැමිණ අය වෙත්. මෙම ගෞතම බුඬ ශාසනයෙහි අතිශයින් උතුම් ශ්‍රමණයෝ නම් ඃ- සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතර මහ ඵලයට පැමිණ නිර්වාණය අවබෝධ කළ උත්තමයෝ වෙත්.

ලෝකයා විසින් මහත් පින්පල සළකා දෙන සිව්පස පිළිගැනීමට යෝග්‍යවූ පින්කෙතක් වූ ඒ අෂ්ටාචාර්ය්‍ය පුද්ගල මහා සඞ්ඝයා අග්‍රදක්ෂිණාර්හ උත්තම ශ්‍රමණයෝ වෙත්, එසේම ඒ සතර මඟ ඵල පිණිස සසුන් වැද පැවිදිව, සතර සංවර සිල් රකින පෘථග්ජන භික්ෂූන් වහන්සේලාද, දක්ෂිණාවට සුදුසු ශ්‍රමණයෝ වෙති. එයට අමතරව මව, පියා, ගුරුවරු ගුණයෙන් නුවණින්, වයසින් වැඩි හිටියෝය. යන මේ අයද සංග්‍රහය ලැබිය යුත්තෝ වෙත්, එහෙයින් එකී වැඩිහිටියන්ටද ආහාරපාන වස්ත්‍රාදිය දීමෙන් උපස්ථාන කළයුතුයි.

මසුරුමල දුරලා සැපදායක ත්‍යාගවත් උතුම් ගුණය සහ කරුණා මෛත්‍රී ගුණ පුරුදු පුහුණු කරන සත් පුරුෂයා තමාසතු යම්කිසිවක් දෙනු කැමැත්ත හටගත් කල්හී ගුණ ඇත්තාවූ හෝ නැත්තා වූ හෝ සම්මුඛවූ කවරෙකුට වුවත් දීමෙන් දාන චේතනාව පුරණවා ඇත. උතුම් ගුණවතුන්ට දීම මහත් ඵල මහානිසංස උපදවන බැවින් එබඳු ගුණවතුන් යොදුන් ඈත සිටියත් සොයා ගෙන ගොස් දන්දී මහත් ආනිසංස උපදවා ගන්නේය.

## දාන විභාගය

පුද්ගලික දානය, සාංඝික දානයයි. ශාසනයෙහි දාන දෙවිධියක් දක්වන ලදී. එහි පුද්ගලික දානය නම් ඃ- එක් එක් පුද්ගලයන්ට දෙන දානයයි. එයින් ඒ ඒ පුද්ගලයින්ගේ ශීලාදී ගුණ ධර්‍මයන්ගේ ප්‍රමාණයේ හැටියට අනුසස් ලැබෙන බැව් දත යුතුය. එවන් දාන 14 ක් වෙත්,

**(1)** ලොව්තුරා සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ නාමකට දෙන දානයක් වෙත්ද, එය පළමුවන පුද්ගලික දානය වේ. මෙයට වඩා පළමුවන දානයක්, මෙයට වඩා ආනිසංස ඇති අග්‍ර දානයක් ලෝකයෙහි නැත්තේමය.

**(2)** පසේ බුදු කෙනෙකුන් කෙරෙහි දනක් පිරිනමන්නේ නම් ඒ දෙවන පුද්ගලික දානය වේ.

**(3)** තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක රහතුන් වහන්සේ කෙරෙහි දෙන දානය තුන්වන පුද්ගලික දානය වේ. මෙකී දානයන් පරම දක්ෂිණා නාමයෙන් ව්‍යවහාර කරනු ලැබෙත්,

**(4)** රහත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පිළිපන් අර්හත් මාර්ගඥනයෙන් යුක්තවූවාහට දෙන දානය හතරවැනි පුද්ගලික දානය වේ.

**(5)** අනාගාමි ඵලයට පැමිණි ආර්‍යයන් වහන්සේට දෙන දානය පස්වන පුද්ගලික දානය වේ.

**(6)** අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පිළිපදින එම මාර්ගඥානයෙන් යුක්තවූවාහට දෙන දානය හයවෙනි පුද්ගලික දානය වේ.

**(7)** සකෘදාගාමී ඵලයට පත් ආර්‍යයන් වහන්සේට පිරිණමන දානය හත්වන පුද්ගලික දානය වේ.

**(8)** සකෘදාගාමී ඵලයට පැමිණීම පිණිස එම මාර්ගයෙහි පිළිපන් ආර්‍යයන් වහන්සේට දෙන දානය අටවන පුද්ගලික දානය වේ.

**(9)** සෝවාන් ඵලයට පැමිණි ආර්‍යයන් වහන්සේට දෙන දානය නමවන පුද්ගලික දානය වේ.

**(10)** සෝවාන් ඵලය පිණිස පිළිපන් එම මාර්ගඥානයෙන් යුත් අර්‍යයෙන් වහන්සේට දෙන දානය දසවන පුද්ගලික දානය වේ.

**(11)** කරන ලද කුශලාකුශල කර්මය ලෙස සුව දුක් ලැබෙන බැව් දන්නා සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූ හෙයින් පඤ්චකාම ආසාව හැරදමා, තපසට ගොස් බ්‍රහ්මචර්ය්‍ය ශීලයෙහි පිහිටා ලෞකික පඤ්චාභිඥාන උපදවාගත් බාහිර තාපසයන් කෙරෙහි පිරිණමන දානය එකොළොස්වන පුද්ගලික දානය වේ.

**(12)** ශඨප්‍රයෝග, කපටි, කෛරාටික නොවූ එසේම අනුන් නොපෙලා දැහැමෙන් සෙමෙන් ගොවිකම්, වෙළදාම් ආදියෙන් ජීවත්වන පෘතග්ජන සිල්වතෙකු කෙරෙහි පිරිණමන දානය දොළොස්වන පුද්ගලික දානය වේ.

**(13)** පෘථග්ජන දුශ්ශීලයා කෙරෙහි එනම් ගොඩ දිය සතුන් මරා අධර්මයෙන් ජීවත් වන වැදි, කෙවුල්, අධමයා කෙරෙහි පවා දීමට සුදුසු අවස්ථාවක් පැමිණි කල්හි කරුණාවෙන් පින් සළකා දෙන දානය දහතුන්වන පුද්ගලික දානය වේ.

**(14)** බලු, කපුටු ආදී තිරිසනෙකු කෙරෙහි පින්පල සළකා දෙන දානය දහහතරවන පුද්ගලික දානය වේ.

## පුද්ගලික දානානිශංසය.

**(1)** තිරිසනකුට කුස පුරා ආහාරයක් දීමෙන් ආනිසංස සියයක් කැමති විය යුතුයි. නොහොත් ජාති සියයක සුගතියෙහි උපදවා ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා වශයෙන් පන්සියයක් විපාක ඵල ගෙන දෙන්නේය.

**(2)** එසේම පෘථග්ජන දුශ්ශීලයාට දුන් දනින් ආනිසංස දහසක්ද,

(3) පෘථග්ජන ශීලවන්තයාට දුන් දානයෙන් අනුසස් ලක්‍ෂයක්ද,

(4) පස්කම් සැපත අත්හැර බඹසර සිල් රකිමින් ධ්‍යාන භාවනා කරණ බාහිරි තපසෙකුට දුන් දනින් ආනිසංස කෝටි ලක්‍ෂයක්ද,

(5) සෝවාන් ඵලය පිණිස පිළිපන් එම මාර්ගඥානයෙන් යුක්තවූ ආර්‍ය්‍ය පුද්ගලයාට පිරිනැමූ දාන ආනිසංස මෙතකැයි ප්‍රමාණයක් නැත්තේය.

(6) සෝවාන් මාර්ගයට පැමිණි ආර්‍ය්‍යයන් හන්සේ ගැන කවර කථාද ? ඒ එසේ නම්.,

(7) සකෘදාගාමී මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයා ගැන කියනුම කවරේද ? ඒ එසේ නම්.,

(8) සකෘදාගාමී ඵලයට පත් ආර්‍ය්‍යයන් වහන්සේ ගැන කියනුම කවරේද ? ඒ එසේ නම්.,

(9) අනාගාමි මාර්ගයට පත් ආර්‍ය්‍යයන් වහන්සේ ගැන කවර කථාද ? ඒ එසේ නම්.,

(10) අනාගාමි ඵලයට පත් උත්තමයා ගැන කුමට කියමුද ? ඒ එසේ නම්.,

(11) රහත් මාර්ගස්ථ උත්තමයා ගැන කියනුම කවරේද ? ඒ එසේ නම්.,

(12) රහතන් වහන්සේ බවට පත් උත්තමයා ගැන කවර කථාද ? ඒ එසේ නම්.,

**(13)** පසේ බුදුරජාණන් වහන්සේට පිරිනැමූ දානමය ආනිසංස කෙසේ කියා නිම කරන්නද ? ඒ එසේ නම්.,

**(14)** තුන්ලෝකාග්‍ර වූ ලොවුතුරා බුදුරජාණන් වහන්සේ නමකට පිරිනමණ ලද ඉතා ස්වල්ප දෙයකින් වුවද ලැබෙන ආනිසංස කෙසේ නම් කියා නිම කරන්නද ?

අනන්ත අප්‍රමාණ ආනිසංස උපදවන හෙයින් පරම දක්ෂිණාව යයි කියනු ලැබේ. ඒ එසේමැයි අග්‍රප්‍රසාද සූත්‍රයෙහි ඃ-

**(1)** අග්‍රධර්මය යි කියන ලද රත්නත්‍රයෙහි ගුණ දන්නා වූ අග්‍රවශයෙන් රත්නත්‍රයෙහි ප්‍රසන්න වූවන්ටද විශේෂයෙන් දක්ෂිණාර්හ වූ හෙවත් දානයට ඉතා සුදුසු වූ බුදුරජාණන් වහන්සේ කෙරෙහි ප්‍රසන්න වූවන්ටද, රාගාදි සකළ කෙලශයන් සන්සිඳුවීමට යෝග්‍ය වූ හෙයින් සැප ඇත්තාවූ අග්‍රවූ තථාගත ධර්මයෙහි ප්‍රසන්න වූවන්ටද, එසේම නිරුත්තර පින් කෙත් වූ සංඝරත්නයට කෙරෙහි ප්‍රසන්න වූවන්ටද, අග්‍රවූ සැප විපාක වන්නේය.

**(2)** අග්‍රවූ රත්නත්‍රය කෙරෙහි දානය ශ්‍රද්ධා, භක්ති සිතින් පිරිනමන්නාවූ පින්වතුන්ට අග්‍රවූ පින් වැඩෙන්නේය, අග්‍රවූ ආයු, වර්ණ, යස පිරිවර, ගුණ ඝොෂාවසහ සැපයද, කාය බලය සහ ඥාණ බලයද ලැබෙන්නේය.

**(3)** අග්‍රවූ රත්නත්‍රයට දන් දෙන්නාවූ ප්‍රඥාවත් සත්පුරුෂයා අග්‍ර ධර්මයෙහි පැහැදීමෙන් යුක්ත වූයේ දෙවියෙක් වූයේ හෝ මුනුෂ්‍යයෙක් වූයේ හෝ අග්‍ර භාවයට පැමිණ නොහොත් ලෝකොත්තර මාර්ගඵලයට පැමිණ අතිශයින් සතුටු වන්නේය,යි

එහි අදහසයි.

## සාංඝික දාන විභාගය

(1) ධරමානු බුඬ කාලයෙහි භික්ෂු සඬඝයා සහ භික්ෂුණී සංඝයා දෙපස වඩා හිඳුවා මධ්‍යයෙහි පවත්වන ලද බුඬසනයෙහි බුදුරජාණන් වහන්සේ වඩා හිඳුවා බුඬ ප්‍රමුඛ උභතො සංඝයාට දෙන දානය පළමුවන මහා සාංඝික දානය වේ. මෙම බුදුපාමොක් සාංඝික දානයට සමාන ශ්‍රේෂ්ඨ දානයක් ලොකයෙහි වෙනත් නැත්තේමය.

(2) බුදුරජාණන් වහන්සේ පිරිණිවන් පෑ කල්හි උන්වහන්සේගේ ශ්‍රී ශාරීරික ධාතූන් වහන්සේ බුඬාසනයෙහි වඩා හිඳුවා දෙපස උභතො සංඝයා හිඳුවා දෙන දානයද මේ ප්‍රථම සාංඝික දානයම වන්නේය.

(3) තථාගත පරිනිර්වාණයෙන් පසු භික්ෂු භික්ෂුණී උභතො සංඝයා වෙත පිරිනමණ දානය දෙවන සාංඝික දානය වේ.

(4) ගණනක් නියම නොකොට මහා භික්ෂු සංඝයාට පමණක් පිරිනමණ දානය තුන්වන සඬඝ ගත දක්ෂිණාවයි.

(5) එසේම භික්ෂුණී සංඝයාට පිරිණමන දානය සතරවන සංඝගත දක්ෂිණාවයි.

(6) මට මෙපමණ භික්ෂූන් සහ භික්ෂුණීන් සඟින් නියම කරන ලදුව ලැබෙත්වයයි ඉල්වා සංඝයා විසින් නියම කොට දුන් පමණකට දෙන දානය පස්වන සංඝගත දක්ෂිණාවයි.

**(7)** එසේම මට මෙපමණ භික්ෂූන් සඟින් නියම කරන ලදුව ලැබෙත්වයයි ඉල්වා ලද පමණකට පිරිනමණ දානය හයවන සංඝගත දක්ෂිණාවයි.

**(8)** එසේම මට මෙපමණ භික්ෂුණීන් සඟින් ලැබෙන්නට යයි ඉල්වා ලද පමණකට පිරිණමන දානය හත්වන සංඝගත දක්ෂිණාවයි.

සර්‍වඥයන් වහන්සේගේ අගසව් දෙදෙනා වහන්සේ පටන් ගණනින්වත් ගුණයෙන්වත් ප්‍රමාණයක් නැති පුණ්‍ය ක්‍ෂෙත්‍රවූ මහා සංඝ රත්නය සිහි කිරීමෙන් මහත්ඵල මහානිසංස උපදවන දානය සාංඝික දානය වේ. සංඝරත්නය සිහිකර ගන්නට සමර්ථයාම දානය මහත්ඵල මහානිසංස වන්නේය. සඟින් ලැබුණු සංඝයාට දානය පිරිනමණ කල්හී. **" ඉමං භික්ඛං සංඝස්ස දෙම"** "මේ භික්ෂාව සංඝරත්නයට දෙමු " යි යන වාක්‍යය කීවත් නොකීවත් අප පිරිනමන්නේ සාංඝික දානයක් යයි සිතීමම සාංඝිකමය.

වර්‍තමානයේ නොයෙක් දෙනා නොයෙක් ලෙසින් සාංඝික කරණ වාක්‍යය දායකයන් ලවා කියති. එනමුත් දායකයාම තමන්ගේ අදහස් පරිදි වාක්‍යය කියවා එම දානය සංඝගත කටයුතුයි, දායකයෝ නොදනිත්ම නම් භික්ෂු නමකගෙන් අසා දැන ගෙන කිව යුතුයි. එසේත් නොහැකි නම් කියවා ගත යුතුයි. ආහාර දානය සමඟ යම් කිසි පරිෂ්කාරදයක් ඇතොත් මෙසේ කිව යුතුයි.

**" ඉමං භික්ඛං සපරික්ඛාරං භික්ඛු සංඝස්ස දෙම "**

" පිරිකර සහිත මේ භික්ෂාව භික්ෂු සංඝයාට දෙමු " යි යනු එහි අදහසයි. කෙසේ වුවත් සාංඝික දානයෙහි තේරුම දායකයා දැනගත යුතුමයි.

මෙහි විස්තර විභාගය ධර්මධරයන් වෙතින් අසා දැනගත යුතුයි. දහම් පොත් පරිශීලනයද කළ යුතුයි. ඒ මේ සාංඝික දානයෙහි අනුසස් ප්‍රමාණ කොට නොදැක්විය හැක්කේය. කල්ප ලක්ෂයක් ගියත් නොගෙවෙන ආනිසංස බල ඇත්තේය. ඒ එසේමයි.

**" පඨවි සාගරො මෙරු - ඛයං යන්ති යුගක්ඛයෙ**
**කප්පා නිසතසහස්සානි - සංඝෙ දිනාහංන නස්සති "**

" ලෝක කුහරයක් පුරවා තිබෙන මහා පෘතුවිය, මහා මේරු පර්වතය, මහා සාගරය යන මේ පතළ වූ ද, ගැඹුරු වූද, උසස් වූද සාරභාර වස්තුත්‍රය කල්පයක් අවසානයේ විනාශයට යෙත්, නමුත් කල්ප ලක්ෂයක් ගෙවී ගියත් සංඝයා විෂයෙහි දෙන ලද්ද නොනැසෙන්නේය " එසේම ඃ-

**" මානුසිකාච සම්පත්ති - දෙවලොකෙ ච යාරතී**
**යාච නිබ්බාන සම්පත්ති - සබ්බමෙතෙන ලබ්භතී "**

" මිනිස් ලොවට අයත් චක්‍රවර්ති රාජ සම්පත් ආදී සියලු සම්පත්ද, ශක්‍ර සම්පත්ද, දිව්‍ය ඓශ්චර්ය්‍ය සම්පත්ද, බුදු පසේ බුදු සව් යන ත්‍රිවිධ බෝධියෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු නිර්වාණ සම්පත්ද යන මේ ත්‍රිවිධ සම්පත්තිය මේ අනුගාමික නිධාන සංඛ්‍යාත දානමය පුණ්‍යධර්මය කරණ කොටගෙන ලැබෙන්නේය " යි භාග්‍යවත් අතීත් ගෞතම සම්බුදුරජාණන් වහන්සේ විසින් වදාළ සේක.

එනිසා එම දාන විභාගය සහ එහි අනුහස් දක්ඛිණා විභඞ්ග සූත්‍රය, වෙළාම සූත්‍රය, සුමනා සූත්‍රය, සප්පුරිසදාන සූත්‍රය, කාලදාන සූත්‍රය, නිධිකණ්ඩ සූත්‍රය, ගිහිප්‍රතිපදා සූත්‍රය, ආදිත්ත සූත්‍රය සහ සූත්‍ර සංග්‍රහ අර්ත්ථ කථාවෙහි ආ ආ ප්‍රකිර්ණක දාන කථා විනිශ්චය දැයි යන ආදී ධර්මප්‍රදේශයන් ඇසුරු කොට අවබෝධ කටයුතුයි.

## දානමය පුණ්‍යක්‍රියාවේ වටිනාකම සහ ප්‍රයෝජන

දස පාරමිතා ධර්මයන් අතුරෙන් පළමුවන කාරණය වූද,
දස සක්විතිවත් අතුරෙනුත් පළමුවන කාරණය වූද,
දස පින් කිරියාවතිනුත් පළමුවන කාරණය වූද,
සතර සඞ්ග්‍රහ වස්තුවෙනුත් පළමුවන කාරණය වූද,
ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා වස්තුවෙනුත් පළමුවන කාරණය වූද,

මෙම පින්කම බුඬාදී මහා සත්පුරුෂයන් විසින් ආදරයෙන් සේවනය කරණ ලද කටයුතු යයි පණවන ලද මහා පුණ්‍යක්‍රියාවන් බැව් සිතට ගත යුතුයි.

කුමක් පිණිස මේ දානමය පින්කිරියවත පණවන ලද්දේද යත් ඃ- සියලු සසර දුකට මූලකාරණය වූ ලෝභය නොහොත් තෘෂ්ණාව දුරලා ගැනීමෙන් සියලු සැපතට මූලකාරණා වූ කරුණා, මෛත්‍රී සහගත ත්‍යාග ගුණය පුරුදු කිරීම පිණිස මෙම දානමය පුණ්‍ය ක්‍රියාව පණවා තිබේ.

උපනූපන් ජාතියෙහි සිතූ පැතූ සම්පත් ගෙන දෙන්නාවූ ද සියල් සසර දුකින් නිදහස් වූ ශාන්ත නිර්වාණ සම්පත් ලබාගැනීමට හේතු වන්නාවූද, ඒ මේ දන්දීමෙන් උපදවන දානමය පින්කම කල්ප වෘක්‍ෂයක් සිතුමිණි රුවනක් බඳු අනන්ත සැපදායක මහ පින්කමක් වෙයි. දන්දීම කල්‍යාණ මිත්‍රාශ්‍රයෙන් පුරුදු පුහුණු වූවන් විනා නුපුරුදු වූවන් හට කළ නොහැක්කේමය. හොඳ හැටි පුරුදු වූ දන් පින් ඇත්තාට නොදිය හැකි දෙයක් නැත. ජීවිතය පවා දීමට හැකිවන්නේය. එමනිසා සැප කැමැත්තන් විසින් ලෝභ හිත දුරුකර දන්දිය යුත්තේමය. දන්දීම පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේත් වදාළ සේක.

(1) තමන් සන්තක දේ සඟවනු කැමති බව, යමක් දීමට තිබෙන අකමැත්ත යි කියන මසුරුකම හේතුකොට ගෙනද, දන්දීමේ ආනිසංස සිහිකොට වෙනත්, වෙනත් කටයුතු වල යෙදීමෙන් ප්‍රමාදවීම හේතු කොට ගෙනද, ඇතැම් කෙනෙක් මෙසේ මහත් යසස් සැපදායක පින් දහම් නොකරත්, නමුත් දන්දීමෙහි පලවිපාක දන්නා වූ පින්දහම් කැමති අය විසින් දන්දිය යුතුවේ.

(2) මසුරු තැනැත්තා දන් දුන්නොත් තිබෙන වස්තු හීනවෙයි. යන බියට දන් නොදෙන්නේය. එනමුත් දන් නොදීමම ඔහුට භයට හේතුවක් වන්නේය. උපතූපත් ආත්මයක් පාසාම සා පිපාසා දුකටම ගොදුරු වන්නේය. දන්දීමෙන් මෙලොව පරලොව ලැබෙන ආනිසංස විශ්වාස නොකරන මෝඩ මසුරා මෙලොවත්, පරලොවත් පශ්චාත්තාපයට සහ පහත් දුකට ගොදුරු වන්නේය.

(3) එමනිසා අධික ලෝභකම නැතිකොට ලෝභ හිත මැඩ පවත්වා දන් දෙන්නේය. දිය යුත්තේය. එයින් කරගන්නාවූ කුසලානිසංස බලයෙන් මෙලොව, පරලොව දෙකෙහිම පිහිටාධාර වෙන්නේය.

(4) දුර ගමණක් යන්නාවූ කෙනෙක් තමන් සමඟ යන්නාවූ අන්‍යයන්ටත් තමන්ගෙන් යම් වියයුතු යුතුකමක් තිබේනම් එය අවංක සිතින් ඉටුකරන්නේ නම්, එසේ කරන සත්පුරුෂයෝ දන් නොදෙන වුන් මළ කල්හී මෙන් නොමැරෙන්නාහ. (මිය ගිය අය ස්වකීය වස්තුව බෙදා නොදෙන්නාහ. ජීවත්ව සිටින මසුරාද දන් නොදෙන්නේය. එය එසේ නම් මළ තැනැත්තාත් මසුරාත් එම කාරණයෙහිදී එක හා සමාන වන නමුත් දන් දෙන සත්පුරුෂයා එසේ නිෂ්ඵල මරණයෙන් නොමැරෙන්නේය) මෙසේ දන්දීමේ පුරුද්ද තිබෙන්නේ සත්පුරුෂයට අයත් සංසාර පුරුදු ධර්මතාවයකි.

(5) ඇතැම් සත්පුරුෂ කෙනෙක් ස්වල්ප වශයෙන් නමුත් තමා සතු යමක් තිබේනම් එම ස්වල්ප දෙය හෝ අන්‍යයන්ට දීමට කැමති වෙයි. එනමුත් බොහෝ වස්තුව තිබෙන මසුරෝ ඉතා සුලු දෙයක් පවා දීමට කැමති නැත. ස්වල්පයක් ඇති සත්පුරුෂයාගේ දානය එදා බුදුරජාණන් වහන්සේට ඒක සාඨක බමුණා සහ බැමිණිය නම් දෙපළට අයත් එකම සළුව පූජා කිරීම හා සමාන වන්නේය.

පස්වන කාරණයෙන් පෙන්වාදුන් ආකාරයට දන් නොදෙන මසුරු සිටාණන් එයාකාරයට වස්තුව ලැබෙන්නේ කෙසේද ? පින් දහම් කිරීමේදී සිදුවන දෙයක් තමයි හේතු කුසල් අහේතු කුසල් ,
එය මෙසේයි ඃ -

වර්තමානයේ බොහෝ දෙනා නොයෙකුත් ආකාරයේ පුවත් පත් දැන්වීම් වලට රැවටී සූදුවට යොමු වී තිබෙන ආකාරයට දන් දෙන්නේ සැඬි, භක්තියකින්, ගෞරවයකින් තොරවය. දෙන්නන්වාලේ, උජාරුවට සහ බව තෘෂ්ණාවෙන් පතාගෙන ලොතරැයි ටිකට් පත් ගන්න ආකාරයට එවන් අයට එසේ දන් දුන් ආනිසංස ලැබෙන්නේ මට්ඨ කුණ්ඩලී බමුණාට වස්තුව ලැබුණු ආකාරයටත් මෝඩයාට සූදුවෙන් විශාල ධනස්කන්ධයක් ලැබීම ඔහුගේම විනාශය පිණිස පැවතීම අහේතු කුසල් බවට ගැනේ.

(1) මේ ලොකයෙහි මසුරකම් ඇත්තාවූ එහෙයින්ම තද මසුරු වූ නින්දා බසින් භික්ෂූන්ට ගරහන්නා වූ යම් අසත්පුරුෂ කෙනෙක් දන් දෙන්නාවූ අයව වළක්වාද, දායකයාගේ දන් පිනෙන් ලැබිය යුතු ස්වර්ග සැපතට අන්තරාය සහ ප්‍රතිග්‍රාහකයාට ලාභාන්තරය ද තමන් සත්පුරුෂ ගුණයෙන් විනාශ වීමදැයි යන මේ ත්‍රිවිධ අන්තරය කෙරෙත්ද ?

(2) ඔවුන්ට කෙබඳු විපාකයක් වන්නේද ? කෙබඳු පරලොවක් වෙත් ද ? යි ස්වාමිදරුවාණන් විචාරන්නට ආවෙමු. අපි එම කාරණය කෙසේ දනිමුදැයි දේවතාවෙක් බුදුරජාණන් වහන්සේගෙන් විචාළේය.

(3) මේ ලෝකයෙහි මසුරුවූ ස්වභාවය ඇති තද මසුරු කමින් යුත් ප්‍රති ග්‍රාහකයන්ට නින්දා අපහාස කරන්නාවූ යම් කෙනෙක් ශ්‍රද්ධා භක්තියෙන් දන් දෙන්නවුන් එයින් වළක්වත්ද? ඔවුන් අසත් පුරුෂයෝ වෙති.

(4) ඒ අනුන් දෙන දාන වළක්වන අසත් පුරුෂයෝ නිරයෙහිද, තිරිසන් අපායෙහිද, ප්‍රේත අපායෙහිද උපදින්නාහ. යම් හෙයකින් මිනිස් ලොව උත්පත්තියට එත් නම්, යම් තැනක කෑම, ඇඳීම, ක්‍රීඩාදිය දුකසේ ලැබෙත්ද එබඳු සා පිපාසා දුකින් තොර නොවූ දිළිඳු කුලයක උපදින්නාහ.

(5) එම අඥාන සත්වයෝ අනුන්ගෙන් යමක් ප්‍රාර්ථනා කෙරෙත්ද, ඔවුන්ට එම දේ නොලැබෙන්නේයමය. ඉහත ආත්ම භාවයෙහි ඔවුන්ට මෙබඳු දරුණු විපාක වන්නේය. නැවතත් පරලොවෙහි දුගතියට යන්නාහු යයි, වදාළ සේක. නැවතත් ප්‍රශ්න විචාරණ දේවතාවෝ මෙසේද විචාළේය.

" භාග්‍යවතුන් වහන්ස, මෙසේ කාරණය වදාළ ලෙස දැන ගතිමු, මේ හැර තවත් කාරණයක් ඔබ වහන්සේගෙන් විචාරමු. මේ ලෝකයෙහි යම් කෙනෙක් මිනිසත් බැව් ලැබ දුරුවූ මසුරුමල ඇතිව ත්‍රිවිධ රත්නත්‍රය කෙරෙහි ප්‍රසාදව ප්‍රසන්න සිතින් ගෞරව සහිතව දානය පිරිනමත්ද ? එම ශ්‍රද්ධාවත් සත් පුරුෂයන්ට එයින් කෙබඳු ඵල විපාක ලැබෙත්ද ? යි දැන ගැනීමට කැමති" යයි අසා සිටියේය. එකල්හි බුදුරජාණන් වහන්සේ විසින්,

(1) මේ ලෝකයෙහි මිනිසත් බව ලද්දාවූ, දානාදි පුණ්‍ය ක්‍රියාවන්හි ඵල විපාක දන්නාවූ, ලෝභ නැත්තාවූ, යම් කෙනෙක් ත්‍රිවිධ රත්නය කෙරෙහි ශ්‍රද්ධාව, භක්තිය, ගෞරවය ඇත්තාවූ එම සත්පුරුෂයෝ යම් තැනක උපදිත් නම් ඒ පින්වත්හු දෙව් ලොව ප්‍රකට වන්නාහ. දෙව් ලොව උපදින්නාහුය යන අදහසයි.

(2) ඔවුන් මිනිස් ලොව උපදින්නාහු නම් ධන ධාන්‍යාදි සැපතින් ආඪ්‍යවූ උසස් කුලයෙහි උපදිති. යම් කුලයෙක්හි කෑම, ඇඳීම සහ පස්කම් සැප කාම ක්‍රීඩාදිය නිදුකින් සුවසේ ලැබෙත්ද එබඳු කුලයෙහි උපදිති.

(3) වසවත් දෙව්රජ මෙන් අනුන් විසින් රැස්කරන ලද භෝග සම්පත්තිය තමා වසඟයට පැමිණ නිරායාශයෙන් සතුටු වන්නාහ. මේ මෙලොව විපාකයයි. පරලොව වශයෙන් සුගති සැප වින්දනය කරන්නාහ'යි වදාළ සේක.

## <u>ශීලානිශංස</u>

ශීල විභාගය නම් අති විස්තරාත්මක ධර්ම මාර්ගයකි. මුළු බුද්ධාගමෙන් තුනෙන් එකක් ශීල විභාගය ප්‍රකාශිතයි. බුදු දහමේ පළමු කොට පිහිටිය යුතු ඇදහිය යුතු මහා ගුණය නම් ශීලය වේ. ශීල ගුණයෙන් වෙන්වූ කෙනෙකුට බුද්ධාගමෙන් ලැබිය යුතු බලාපොරොත්තුව නොලැබෙන්නේය. එමනිසා ශීලය හඳුනාගෙන සිල් ගුණය සිය දිවිය මෙන් ආරක්ෂා කළ යුතුය. භාග්‍යවතුන් වහන්සේ එක් තැනකදී ශීලය ගැන දේශනාකර තිබෙන්නේ විශුද්ධිමාර්ගයේ හි " ශීලනිදේශ " නම් වූ ප්‍රථම පරිච්ඡේද යෙහි ය. එය ඉගෙන ගැනීමට උත්සහ කළ යුතුමය. එයිනුත් විශේෂයෙන්ම විස්තර වන්නේ අධිශීල ශික්ෂා සංඛ්‍යාත භික්ෂු ශීලය ගැනයි.

ප්‍රාණඝාත, මුසාවාදා දි කායික, වාචසික පාපක්‍රියා වලින් වළක්නා සත් පුරුෂයන්ට සහ තුනුරුවන් කෙරෙහි වත් පිළිවෙත් පුරන්න වූවන්ට කාලයෙන් කාලයට සිත හටගන්නා පිරිසිදු චේතනාදි ස්වභාව ධර්මයෝ සිල් නම් වෙත්. ඒ ඒ වරදින් වළක්නා විරති චෛතසිකයෝද සිල් නම් වෙත්. එබඳු සිල්ගුණ අප්‍රමාණ වෙත්. නමුත් ගිහියන් විසින් රැකිය යුතු පන්සිල්, අටසිල්, දස සිල් ආදී සිල් සහ ප්‍රව්‍රජ්‍යාද ශීලය භික්ෂු (උපසම්පදා) ශීලය දැයි යන මේ ආදී ශීල විභාග වෙත්.

පන්සිල්, අටසිල්, දස සිල් සමාදන් වන්නා හට එම ශීල සමාදන් වන අවස්ථාවේ එකී, එකී පාප ක්‍රියාවන්ගෙන් වෙන්වීම සිදුකරන චේතනා රාශියද, එසේ සිල් සමාදන්ව එම ශීල ගුණයෙන් රක්‍ෂා කරන්නා හටද ශික්‍ෂා පද සමාදන් නොවීම වුවත් පැමිණි, පැමිණි පාපක්‍රියාවන්ගෙන් වැළකීම යයි කියන ලද සම්ප්‍රාප්ත විරති වශයෙන් කය, වචනය දෙක වරදින් වළක්වා ගන්නාහටද, පැවිදි වන්නාහට සහ උපසම්පදා මාලකයෙහි ඒ අධිශීල ශික්‍ෂා සමාදන් වන්නාහටද, ඒ ශ්‍රමණ ධර්මයයි කියන ලද චතුපාරිශුද්ධි ශීලය පුරන්නා හටද, කාලානුරූපව සිතෙහි හටගන්නා පිරිසිදු චේතනා රාශිය සිල් නම් වෙත්.

මෙකී ශීල ගුණය සම්බුද්ධ ශාසනයෙහි ප්‍රධාන ගුණය වේ. පළමු කොට පිළිපැදිය යුතු උත්තම ප්‍රතිපදාව නම් මේ ශීල ගුණය වේ. ගිහියකු විසින් වේවා, පැවිද්දකු විසින් වේවා පළමු කොට ශීලයෙහිම පිහිටිය යුතුයි. සිල් රැකුම නොසළකා ඇතැම් අය නොයෙකුත් පින්කම් කරති, සිල් නොරැක ශාසනය දියුණු කරන්නට දඟලති. ශීලය ආරක්‍ෂා නොකරන පින්කම් සාර්ථක නොවන්නේය. සිල් ගුණය නොකරන්නහට ශාසනයෙහි වෘද්ධියක් නොවන්නේය. එමනිසා ශීල ගුණයම උතුම් කොට සැළකිය යුතුයි. කුමක් වන නිසාද යත් ? ශීලයක් නැති තැනැත්තා හට උතුම් බුදුසසුනකින් උතුම් පිහිටක් ලැබෙන්නේද නැත.

**සාසනෙ කුලපුත්තානං - පතිට්ඨා නත්ථි යි විනා**
**ආනිසංස පරිච්ඡෙදං - තස්ස සීලස්ස කොවදෙ**

ඉහත සඳහන් ගාථා පාඨයේ තේරුම ඃ-

මේ ශාසනයෙහි කුල පුත්‍රයින්ට යම් ශීල ගුණයක් හා අන් පිහිටක් නැත්තේද, එම ශීලයාගේ ආනිසංස මෙතෙකැයි පිරිසිඳ කවරෙක් නම් කියන්නේද, කියන්ට සමර්ථද නොවන්නේය' යි ගථාවෙහි තේරුමයි.

දඹදිව හිමාලයෙන් ගලා යන ගංගා, යමුනා, සරභූ, සරස්වතී, අචිරවතී, මහී යන මෙකී මහා ගංගාවෝ වෙත්ද, ඒ සියළු මහා ගඟ ජලය පවා මේ ලෝක වාසීන්ගේ කෙළෙස් මළ ධෝවනයට අසමර්ථ වන්නේය. යම් මේ ශීල නමැති ජලයක් වේද, ශීල නමැති ජලයම සත්වයන්ගේ කෙලෙස් කිළිටු ඒ කාන්තයෙන්ම පිරිසිඳු කරන්නේය.

මේ ලෝක සත්වයන්ගේ යම් ක්ලේශ දාහයක් වේද, ඒ ක්ලේශ ග්‍රීෂ්මය සිසිල් වැසි පොද සහිත වාතයෝද නොසන්සිඳුවකි. සඳුන් කල්කයද, චන්ද්‍රමාණික්‍යයෝද, සඳ එළියෙන්ද නොසන්සිඳුවත්, (එසේනම් කුමකින් සන්සිඳුවන්නේද යත්,) මනා කොට රක්‍ෂා කරන ලද ඉතා සිසිල් වූ යම් උතුම් අර්‍ය ශීලයක් වේද ඒ ශීලයම කෙළෙස් විඩා සන්සිඳුවන්නේය.

යම් බඳුවූ ශීලගුණ සුගන්ධයෙන් උඩු සුළඟටත්, යටි සුළඟටත් සමානව හමාද, එහෙයින් ඒ ශීල සුගන්ධයට සමාන සුවඳක් කොහෙන් නම් ලැබෙන්නේද, නොලැබෙන්නේය.

සීලය සමාන දේව්ලොවට නැගෙන හිණිමඟක් කොයින්ද ? සීලය වනාහි නිවන්පුර වැදීමට දොරටුවක් වන්නේය.

ශීලාලංකාරයෙන් සැරසුනා වූ භික්ෂුවකගේ යම් උතුම් ශෝභාවක් වේද, එබඳු අලංකාරයක් මුක්තා මාණික්‍ය සහිත සිව්සැට බරණින් සැරසුණු රජෙකුටද නැත්තේය.

අත්තානුවාද භය, පරානුවාදාදි භය සර්වප්‍රකාරයෙන් විධ්වංශනය කරන්නේය. සීලවන්තයාගේ ඒ සිල් ගුණය හැම කල්හී කීර්තියද, සතුටද උපදවන්නේය.

සියලු ගුණයන්ට මුල් වූ එසේම රාග, කෝප පාපයන්ගෙන් බලය නසන්නාවූ, සීලානිසංස මෙසේ දත යුතුයි. මේ ශීලයාගේ වූ ප්‍රධාන ශිලානිශංස කථාව දැන සීලය ආරක්ෂා කළයුතු වන්නේය.

මීට මෙතැති,
පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි,
ගුණරත්න යෝගාශ්‍රමය,
තල්වත්ත,
කැළණිය.
18.12.2015

**(අති පූජණීය, වන්දණීය, කහගොල්ලේ සෝමවංස මාහිමිපාණන් වහන්සේගේ 50 වන සුබ උපන් දිනය සමරා)**

පළමු ඉන්දීය ලෝක රූ රැජින

එදා සහ අද



1966



2012

